# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010**
**2011 අප්‍රේල් / මැයි**

**සමාජීය විද්‍යා පීඨය**

**දේශපාලන විද්‍යාව - POLS - E 1015**

**දේශපාලන න්‍යාය හා ක්‍රියාවලීන්**

**ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. දේශපාලන විද්‍යාවේ උප විෂය ක්ෂේත්‍ර කෙටියෙන් විස්තර කරන්න.

02. හොබ්ස්ගේ සහ ලොක්ගේ විග්‍රහ පිළිබඳ විශේෂ අවධානය යොමුකරමින් සමාජ සම්මුතිවාදී න්‍යාය විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

03. "බලතල බෙදීමේ න්‍යායෙන් ආණ්ඩුවේ තෙවැදෑරුම් කාර්යයන් එකිනෙකින් වෙන්ව පැවතිය යුතු බව යෝජනා වේ." සාකච්ඡා කරන්න.

04. රාජ්‍යය පිළිබඳ ලිබරල්වාදී න්‍යාය පරීක්ෂා කරන්න.

05. "සියල්ල රාජ්‍යය වෙනුවෙනි ; රාජ්‍යයට එරෙහි කිසිවක් නොමැත ; රාජ්‍යයෙන් පිටත කිසිවක් නොමැත." (මුසෝලිනි) මෙම ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න.

06. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්ද?
ලිඛිත හා අලිඛිත ව්‍යවස්ථා අතර වෙනස්කම් සඳහන් කරන්න.

07. නව යටත් විජිතවාදය නැමති සංකල්පය අර්ථ දක්වන්න. සංවර්ධනය වෙමින් පවතින රටවල් සහ අධිරාජ්‍ය පිහිටුවා ගෙන සිටි බලවතුන් අතර පවතින වෙනස් වූ සම්බන්ධතාවයේ ස්වරූපය විමර්ශනය කරන්න.

08. "ස්ත්‍රීන්ගේ සමාජ කාර්යභාරය වර්ධනය කිරීම අරමුණු කරගත් දේශපාලන මතවාදයක් ලෙස ස්ත්‍රීවාදය හැඳින්විය හැක." විස්තර කරන්න.

09. පහත මාතෘකා අතුරින් <u>දෙකක් (02)</u> යටතේ සටහන් ලියන්න.

    1. ප්‍රජාතන්ත්‍රවාදය
    2. මානව අයිතිවාසිකම්
    3. ප්‍රවර්තනීය සංවර්ධනය
    4. ව්‍යවස්ථානුකූලවාදය
    5. නියෝජන සංකල්පය

******************************